**කොළඹ අගනගර ආශ්‍රිත නාගරික සංවර්ධන ව්‍යාපෘතිය - 2018**

-----------------------------------------------------------------------

කොළඹ අගනගර ආශ්‍රිත නාගරික සංවර්ධන ව්‍යාපෘතියේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ප්‍රතිසංස්කරණය හා සංවර්ධනය සඳහා වූ අන්තර්ජාතික බැංකුව අතර 2012 මැයි 18 දින එළඹි අංක 8145 - එල්කේ දරන ණය ගිවිසුමේ 2 උපලේඛනයේ II වගන්තිය (ආ.3) සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

-----------------------------------------------------------------

ව්‍යාපෘතියේ ණය ගිවිසුම අනුව, මහනගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතන වන අතර නාගරික සංවර්ධන අධිකාරිය, ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව සහ කොළඹ මහනගර සභාව ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. කොළඹ ජල ද්‍රෝණිය පෝෂක ප්‍රදේශයේ ජලගැල්ම අඩුකිරීම, කොළඹ අගනගරයේ පළාත් පාලන ආයතනවල ධාරිතාවය ශක්තිමත් කිරීම සහ තෝරාගත් ආදර්ශන ආයෝජනයන් මඟින් ප්‍රාදේශීය යටිතල හා සේවා වැඩිදියුණු කිරීම හා නඩත්තු කිරීම ව්‍යාපෘතියේ අරමුණ වේ. ණය ගිවිසුම අනුව ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු. මිලියන 42,031.74 කට සමාන එ.ජ.ඩො. මිලියන 321 ක් වන අතර ඉන් රු.මිලියන 27,890.22 කට සමාන එ.ජ.ඩො මිලියන 213 ක් මූල්‍යායනය කිරීමට ප්‍රතිසංස්කරණය හා සංවර්ධනය සඳහා වූ අන්තර්ජාතික බැංකුව එකඟ වී තිබුණි. ඉතිරි මුදල වන රු. මිලියන 14,141.52 ක් ශ්‍රී ලංකා රජය මඟින් මූල්‍යානය කිරීමට අපේක්ෂා කෙරේ. ව්‍යාපෘතිය එහි කටයුතු 2012 ජූලි 10 දින ආරම්භ කරන ලද අතර 2017 ජූනි 30 වන විට නිම කිරීමට සැලසුම් කර තිබුණි. කෙසේවෙතත් ව්‍යාපෘතියේ කටයුතු නිමකිරීමේ දිනය 2020 ජූනි 30 දක්වා දිර්ඝකර තිබුණි.

## 1.3 මතය

------

ව්‍යාපෘතියේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ක්‍රියාකාරිත්වය හා එහි මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම

-------------------

ශ්‍රී ලංකා විගණන ප්‍රමිත වලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදුකරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

-----------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---------------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත් , ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරිමේදි එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කීරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශන වල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනිමේදි හා තක්සේරු කිරීමේදි අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබාගන්නා ලද නමුත් අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් වල යෝග්‍යතාවය අගයන ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශන වල ඉදිරිපත් කිරීම ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කළ අතර ඒ සඳහා පාදක වූ ගණුදෙනු හා සිද්ධින් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී .මාගේ විගණනය තුළදි හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.1 නීතිරීති රෙගුලාසි වලට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | නීතිරීති රෙගුලාසි වලට යොමුව | විගණන ගැටළුව | බලපෑම | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|---|
| (අ) | කළමණාකරන සේවා දෙපාර්තමේන්තුවේ 2016 මාර්තු 24 දිනැති අංක 01/2016 දරණ චක්‍රලේඛයේ 9.3 ඡේදය | සමාලෝචිත වර්ෂය තුළදී ව්‍යාපෘති නියාමන කමිටු රැස්වීම 02 ක් පමණක් පවත්වා තිබුණි. | ව්‍යාපෘතියේ භෞතික කාර්ය සාධනය පිළිබඳ අධීක්ෂණ යාන්ත්‍රණය දුර්වලවීම. | නොවැලැක්විය හැකි හේතුන් නිසා සමාලෝචිත වර්ෂය තුළදී රැස්වීම් 02 ක් පමණක් පවත්වා තිබුණි. | චක්‍රලේඛ අවශ්‍යතාවයන්ට අනුගත විය යුතු වේ. |
| (ආ) | ව්‍යාපෘති ඇගයීම් වාර්තාවේ III - වගන්තිය | මෙම රෙගුලාසියට පටහැනිව ව්‍යාපෘතිය විසින් උපයන විට ගෙවීමේ හා රඳවා ගැනීමේ බදු රුපියල් මිලියන 7.32 ක් ගෙවා තිබුණි. | ණය මුදල් අයථා ලෙස පරිහරණය කිරීම | මෙම බදු උපදේශකවරුන්ට ගෙවන සෘජු ගෙවීම් වලට අදාල වන අතර දේශීය අරමුදල් වලින් පියවිය නොහැක | ණය නියෝජිතායතනය සහ විදේශ සම්පත් දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡා කළ යුතුය. |

3. භෞතික කාර්යසාධනය

---

3.1 ව්‍යාපෘති කටයුතුවල භෞතික හා මූල්‍ය කාර්යසාධනය

---

ව්‍යාපෘති කටයුතු ගංවතුර හා ජලාපවහන කළමනාකරණය සහ කොළඹ අගනගරය ප්‍රදේශයේ පළාත් පාලන ආයතනවලට සහායවීම යන සංරචක 02 ක යටතේ ඉදිකිරීම් කොන්ත්‍රාත්තු 56 යටතේ ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණි. ඉන් 2018 දෙසැම්බර් 31 දිනට මාස 1 සිට 10 දක්වා ප්‍රමාදයන් සහිතව රුපියල් මිලියන 10,335 ක පිරිවැයකට ඉදිකිරීම් කොන්ත්‍රාත්තු 38 ක කටයුතු පමණක් අවසන් කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | ක්‍රියාකාරකම | 2018 දෙසැම්බර් 31 දිනට භෞතික කාර්යසාධනය ඉලක්කය % | අත්පත් කරගැනීම් % | බලපෑම | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|---|---|
| 1. | මාදිවෙල නැගෙනහිර හැරවුම් යෝජනා ක්‍රමය වැඩි දියුණු කිරීම | 100 | 52 | නිශ්චිත කාල සීමාවන් තුළදී අපේක්ෂිත ප්‍රතිලාභ ඇල්ම ඇති පාර්ශවයන් වෙත නොලැබේ. | අදහස් දක්වා නොමැත. | ඇල්ම ඇති පාර්ශවයන්ට ප්‍රතිලාභ ලබා ගැනීමට හැකිවන පරිදි ප්‍රමාදයන් මගහරවා ගැනීමට කඩිනම් පියවර ගැනීම අවශ්‍ය වේ. |
| 2. | ශාන්ත සෙබස්තියන් උතුරු දියකුලු දොරවල් හා ජල පොම්පාගාරය සැලසුම් කිරීම හා ඉදිකිරීම | 63 | 43 | | | |
| 3. | නව මෝදර හා ටොරින්ටන් උමං මාර්ග සැලසුම් කිරීම හා ඉදිකිරීම | 13.5 | 11 | | | |
| 4. | බේරේ වැව බටහිර කොටසේ බටහිර ඉවුරේ ඉවුරු ආරක්ෂණ ඉදිකිරීම - අදියර - II | 62 | 37 | | | |
| 5. | අඹතලේ ජල පොම්පාගාරය සැලසුම් කිරීම හා ඉදිකිරීම | සඳහන් කර නොමැත | ආරම්භ කර නැත | | | |
| 6. | නොරිස් ඇළ වැඩි දියුණු කිරීම | 10 | 06 | | | |
| 7. | කොළොන්නාව ඇළ හැරවුම් යෝජනා ක්‍රමය, අදියර - II | 85 | 37 | | | |

8. කොළොන්නාව ඇළ හැරවුම් යෝජනා ක්‍රමය, අදියර - III

| | | |
|---|---|---|
| | සදහන් කර නොමැත | ආරම්භ කර නැත |

9. කොටු බැම්ම උද්‍යානය ස්ථාපනය කිරීම

| | | |
|---|---|---|
| | සදහන් කර නොමැත | ආරම්භ කර නැත |

**3.2 කොන්ත්‍රාත් පරිපාලනය**

**---------------------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන ගැටළුව | බලපෑම | කළමනාරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|
| **(අ) <u>බේරේ වැව දිගේ රේඛීය උද්‍යාන ඉදිකිරීම - පියවර II</u>** | | | |
| රු.මිලියන 343.45 ක ඉංජිනේරු ඇස්තමේන්තුව වෙනුවට රු.මිලියන 294.15 ක පිරිවැයකට කොන්ත්‍රාත්තුව පිරිනමා තිබුණු බව නිරීක්ෂණය විය. කෙසේවෙතත් එම කටයුතු රු.මිලියන 157.72 ක පිරිවැයකට නිමකර තිබුණි. තවද, වැඩ විෂය පථයේ කරන ලද වෙනස්කම් හේතුවෙන් පිරිවැය රු.මිලියන 9.75 ක ඇස්තමේන්තුගත වැඩ පසුව අවලංගු කර තිබුණි. කෙසේවෙතත් මුල් ඉංජිනේරු ඇස්තමේන්තුව මත කොන්ත්‍රාත්කරුට රු.මිලියන 47.9 ක වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් මුදලක් නිකුත් කර තිබුණි. | අමතරව වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් නිකුත් කිරීම තුළින් මූල්‍යමය වාසි ලබාගැනීමට අවස්ථා ලබාදී ඇත. | ජාතික ජල සම්පාදන සහ ජලාපවාහන මණ්ඩලය මගින් අනෙකුත් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම හේතුවෙන් ප්‍රාරම්භක ඉංජිනේරු ඇස්තමේන්තුවේ යෝජිත ඉදිකිරීම් වැඩ වෙනස් කිරීමට සිදුවිය. තවද, පාවෙන තෙත්බිම්, Geo Cell Malt යනාදි කටයුතු සිදු නොකිරීම හේතුවෙන් රු.මිලියන 70 ක පිරිවැයකට ඇස්තමේන්තු කරන ලද කටයුතු ඉවත් කර තිබුණි. කෙසේවෙතත් පොදු කොන්දේසිවල 126 උපවගන්තිය අනුව කොන්ත්‍රාත්කරුට ලාභය අහිමි වීම ඉල්ලුම් කිරීමට සම්මුතික බැඳීමක් නොමැත. | වැඩ විෂය පථය තීරණය කිරීමට සහ නිවැරදි ආකාරයට ඇස්තමේන්තු පිළියෙල කිරීමේ අරමුණින් අනෙකුත් ආයතන සමඟ සුහද සම්බන්ධතාවයක් පවත්වාගෙන යාමට පියවර ගැනීම අවශ්‍ය වේ. |

## (ආ) ටොරින්ටන් සහ නව මෝදර උමං මාර්ග සැලසුම් කිරීමේ සහ ඉදිකිරීමේ ව්‍යාපෘතිය

| | | | | |
|---|---|---|---|---|
| (i) | 2018 මැයි 30 දින එ.ජ.ඩො මිලියන 32.09 සහ රු.මිලියන 246.06 ක පිරිවැයකට මෝදර සහ ටොරින්ටන් උමං මාර්ග සැලසුම් කිරීම සහ ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව පිරිනමා තිබුණු අතර වර්ෂ 2 ක කාලපරිච්ඡේදයක් තුළ නිම කිරීමට සැලසුම් කර තිබුණි. කෙසේවෙතත් 2018 දෙසැම්බර් 31 දින වන විටත් අවශ්‍ය උපකරණ යොදවා නොතිබුණු බව නිරීක්ෂණය විය. | කොන්ත්‍රාත්තුව නිම කිරීමේ ප්‍රමාදයක් සිදුවිය හැක. | ව්‍යාපෘතිය අවසන් කිරීමේ දිනයට බලපෑමක් නොමැතිව මෝදර සහ ටොරින්ටන් උමං මාර්ග සැලසුම් කිරීම සහ ඉදිකිරීම සඳහා ඉදිකිරීම් සැලැස්ම සංශෝධනය කර තිබුණි. තවද, භූ තාක්ෂණික විමර්ශන යටතේ කටයුතු සඳහා කාලය ගතවන අතර මිනින්දෝරු දෙපාර්තමේතුවේ තහවුරුව සමග මේ වන විට නිමකර ඇති සැලසුම් ක්‍රියාවලිය ප්‍රධාන සැලසුම ක්‍රියාවලියේ ප්‍රධාන පූර්වාවශ්‍යතාවයන් මේ වන විට අවසන් කර ඇත. | ප්‍රමාදයන් ආවරණය කිරීම සඳහා කඩිනම් වැඩසටහන් පිළියෙල කිරීම අවශ්‍ය වේ. |
| (ii) | 2018 දෙසැම්බර් 31 දිනට ටොරින්ටන් සහ මෝදර උමං මාර්ග ඉදිකිරීමේ භෞතික ඉලක්ක සියයට 13.5 ක් අත්කර ගැනීමට අපේක්ෂා කර තිබුණි. කෙසේවෙතත් එදිනට සියයට 11 ප්‍රගතියක් පමණක් අත්පත් කරගෙන තිබුණි. කොන්ත්‍රාත්තු ගිවිසුමට 8.4 වගන්තියේ කොන්දේසි අනුව ව්‍යාපෘතියේ කළමනාකරණ ඒකකය කොන්ත්‍රාත්කරුගෙන් සංශෝධිත කටයුතු පිළිබඳ වැඩසටහනක් ලබාගැනීමට පියවර ගෙන නොතිබුණි. | ව්‍යාපෘතියේ කටයුතු අවසන් කිරීමේ ප්‍රමාදයන් සහ කොන්ත්‍රාත්තුවේ කාලපරිච්ඡේදය දීර්ඝ වීමේ හැකියාව පවතී. | නිසි පරිදි අදහස් දක්වා නොතිබුණි. | කොන්ත්‍රාත්කරුගෙන් කඩිනමින් කටයුතු පිළිබඳ සංශෝධිත වැඩසැලැස්ම ලබා ගැනීම අවශ්‍ය වේ. වහාම ක්‍රියාත්මක වන පරිදි කොන්ත්‍රාත්කරුගෙන් කැඳවිය යුතුය. |
| (iii) | කොන්ත්‍රාත් ගිවිසුමේ යොමුගත කොන්දේසිවල අංක 06 වගන්තියට එරෙහිව එකඟවූ ආකෘතිය ප්‍රකාරව උපදේශක විසින් ව්‍යාපෘති | ව්‍යාපෘති අධීක්ෂණ කටයුතු කාර්යක්ෂම ආකාරයට සිදුකර නොමැත. | නිසි පරිදි අදහස් දක්වා නොමැත. | එකඟවූ ආකෘතිය ප්‍රකාරව ප්‍රගති වාර්තා පිළියෙල කළ යුතු අතර කාලෝචිතව තීරණ ගැනීම සඳහා සන්නිවේදනය කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | කළමනාකරණ ඒකකය වෙත මාසික ප්‍රගති වාර්තා පිළියෙල කර ඉදිරිපත් කර නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස ප්‍රගති වාර්තා ප්‍රමාණාත්මක පදනමක් මත ඉදිරිපත් කර නොතිබුණු අතර කටයුතු පිළිබඳ වැඩසටහන සමඟ සැසඳීමට නොහැකි විය. | | | |
| (iv) | 2018 දෙසැම්බර් 31 දිනට උපදේශකගේ මාසික ප්‍රගති වාර්තා අනුව එදිනට සැලසුම් තත්ත්ව වාර්තා 102 කින් වාර්තා 03 ක් පමණක් අවසන් කර තිබුණි. කෙසේවෙතත් කාලෝචිත වාර්තා ඉදිරිපත් කිරිමේ ඔවුන්ගේ වගකීම සලකා බැලීමකින් තොරව විදේශ උපදේශන සමාගමකට එ.ජ.ඩො 333,564 ක් ගෙවා තිබුණි. | භෞතික ප්‍රගතිය සැලකීමකින් තොරව ගෙවීම් සිදුකර ඇත. | ඉංජිනේරු සැලැස්මක් පිළියෙල කිරීම සැලසුම් කටයුත්තක ප්‍රතිඵලයක් පමණක් වන අතර එය කාලය ගතවන ක්‍රියාවලියකි. අවශ්‍ය තාක්ෂණික අනුපිළිවෙල අනුව එය තර්කානුකූලව ගොඩනැගිය යුතුය. | සැලසුම් කටයුතු ප්‍රවේසමින් සම්බන්ධීකරණය සහ ඒ සම්බන්ධ ප්‍රගතිය ඇගයීම කල යුතුය. |
| (ඇ) | **<u>බේරේ වැව දිගේ රේඛීය උද්‍යාන ඉදිකිරීම - පියවර 1</u>** | | | |
| (i) | කොන්ත්‍රාත්තුව රු.මිලියන 184.26 ක පිරිවැයකට ප්‍රදානය කර තිබුණු අතර කටයුතු රු.මිලියන 142.72 ක පිරිවැයකට අවසන් කර තිබුණි. ව්‍යාපෘතිය යටතේ බොහෝ වැඩසටහන් කොළඹ නගරය තුළ ක්‍රියාත්මක කරන ලද අනෙකුත් විශාල ව්‍යාපෘති යටතේ සිදුකිරීමට සැලසුම් කර තිබීම හේතුවෙන් වැඩ විෂය පථය අඩුකර තිබුණි. | (අ) සැලසුම් කිරීම සහ සිදුකරන ලද වැඩ සඳහා කාලය සහ පිරිවැය නාස්ති වීමේ හැකියාව පවතී.<br>(ආ) වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් මුදල ලබාදීමෙන් කොන්ත්‍රාත්කරුට මූල්‍යමය වාසි ලබා ගැනීමට අවස්ථාව ලබාදීම. | කොළඹ නගරය තුළ ක්‍රියාත්මක කරන ලද අනෙකුත් විශාල ව්‍යාපෘති හේතුවෙන් ව්‍යුහාත්මක වෙනස්කම් කිහිපයක් සිදුකිරීම සිදුවිය. | අදාළ ව්‍යාපෘති මඟින් සිදු කරනු ලබන කටයුතුවල ස්වභාවය අවබෝධකර ගැනීම සඳහා අනෙකුත් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතන සමඟ මනා සම්බන්ධතාවයක් පවත්වා ගැනීම අවශ්‍ය වේ. |

| | | | | |
|---|---|---|---|---|
| (ii) | කොන්ත්‍රාත් පිරිවිතර අංක 14.3.7 ට අනුව කොන්ත්‍රාත්කරු විසින් භූමි අලංකරණ නඩත්තු අත්පොත ඉදිරිපත් කිරීමට අවශ්‍ය වන අතර එය පිළියෙල කර ඉදිරිපත් කර නොතිබුණි. | රු.මිලියන 21.58 ක පිරිවැයකට සිදුකරන ලද භූමි අලංකාරකරණය කටයුතු නඩත්තු කිරීමේ අවධානමක පවතී. | කොන්ත්‍රාත් ලියවිලිවල සඳහන් වගකීම් සමඟ අනුගත වීමට කොන්ත්‍රාත්කරුට අවශ්‍ය උපදෙස් ලබාදී තිබුණි. | කොන්ත්‍රාත්කරුට වගකීම් සමඟ අනුගතවීමට බලපෑම් කිරීමට කඩිනම් පියවර ගැනීම අවශ්‍ය වේ. |

**3.3 වැඩබිම් පරීක්ෂාවේදී සිදුකරන ලද නිරීක්ෂණ**

----------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන ගැටළුව | බලපෑම | කළමනාකරණයේ ප්‍රතිචාර | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|
| (අ) | **බේරේ වැව දිගේ රේඛීය උද්‍යාන ඉදිකිරීම - පියවර II** | | | |
| (i) | උපදේශකගේ නිර්දේශ අනුව උද්‍යානයේ ආසන සඳහා කුඹුක් හෝ තේක්ක දැව භාවිතා කළ යුතුය. කෙසේවෙතත් රු.මිලියන 7.90 ක පිරිවැයකට ආසන සවිකිරීම කිරීම සඳහා වෙනත් වර්ගයක දැව යොදාගෙන තිබුණු බව රාජ්‍ය දැව සංස්ථාව විසින් පරීක්ෂා කරන ලද සාම්පල් මඟින් සනාථ විය. | ඉදිකරන ලද ආසන පිරිවිතරයන් සමඟ අනුගත නොවුණු අතර ආසනවල කල්පැවැත්ම පිළිබඳ සැකයක් පවතී. | පරීක්ෂණ වාර්තාවලට අනුව සාම්පල් සඳහා යොදාගන්නා ලද දැව වර්ගය සුරියමාර විය. ගෙවීම් වෙනස් කිරීම සඳහා පියවර ගනු ලැබේ. | පිරිවිතරයක් සමඟ අනුගත වීම අවශ්‍ය වන අතර අයිතමවල කල්පැවැත්ම පිළිබඳ සහතික විය යුතුය. |
| (ii) | ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ වාර්තා අනුව රු.මිලියන 4.44 ක ඇස්තමේන්තුගත පිරිවැයකට වර්ග මීටර 1,380 ක අතුරන ලද කුට්ටි ගල් පිරිවිතරයේ දක්වා තිබුණු අවශ්‍ය ශක්තිමත්භාවයට අනුගත වී නොතිබුණි. | ව්‍යාපෘතියේ කටයුතුවල අරමුණු තිරසාර ආකාරයට ලඟා කර ගැනීමට නොහැකි වේ. | විධිමත් ආකාරයට අදහස් දක්වා නොමැත. | අඩුපාඩු අවම කර ගැනීමට කොන්ත්‍රාත්කරුට උපදෙස් දීම අවශ්‍ය වන අතර ඒ අනුව ගෙවීම් වෙනස් කර ගැනීමට අවශ්‍ය වේ. |
| (III) | පරිවිතර අවශ්‍යතා අනුව visual barriers සහ picnic table ඉදිකිරීම සඳහා ඝනකම GI පයිප්ප යොදාගෙන නොතිබුණු අතර ඒ මත එකතුව රු.මිලියන 8.99 ක් ගෙවා තිබුණි. | -එම- | කොන්ත්‍රාත් පිරිවිතරයන්ට අනුව මෙම අරමුණු සඳහා GI පයිප්ප යොදාගෙන නොතිබුණු බව හඳුනාගෙන තිබුණි. ගැටළුව නිවැරදි කිරීමට අවශ්‍ය පියවර ගනු ලැබේ. | කොන්ත්‍රාත්කරුවන් විසින් සිදුකරන කටයුතුවල ගුණාත්මකභාවය සහතික කිරීමට පාලනයන් ශක්තිමත් කිරීම පියවර ගැනීම අවශ්‍ය වේ. |

(ආ) **<u>බේරේ වැව දිගේ රේඛීය උද්‍යානය ඉදිකිරීම පියවර - 1</u>**

| | | | | |
|---|---|---|---|---|
| (i) | යොදා ගන්නා ලද දැවවල ගුණාත්මය තහවුරු කිරීමට පරීක්ෂණ වාර්තා ලබා ගැනීමකින් තොරව සිදුකරන ලද දැව කටයුතු වෙනුවෙන් එකතුව රු.මිලියන 1.80 ක් ගෙවා තිබුණු බව නිරීක්ෂණය විය. | දැව කටයුතුවල කල්පැවැත්ම පිළිබඳ සහතික විය නොහැක. | කොන්ත්‍රාත්කරු විසින් අනුමත කරන ලද දැව සාම්පලයට අනුව ආසනවල දැවමය කොටස සවිකර ඇත. | ගෙවීම් නිරවුල් කිරීමට පෙර පරීක්ෂණ වාර්තා ලබා ගැනීම අවශ්‍ය වන අතර ඒ පිළිබඳ අභ්‍යන්තර පාලනය පිළිබඳ සහතික විය යුතුය. |
| (ii) | ගංවතුර සහ ජලාපවාහන කළමනාකරණ සංරචකය යටතේ රු.මිලියන 4,822.50 ක පිරිවැයකට ක්‍රියාත්මක කරන ලද උප ව්‍යාපෘති 04 ක් යටතේ සිදුකරන ලද වැඩ සඳහා කැබිනට් අනුමැතිය ලබාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය. | ව්‍යාපෘති මඟින් අනුමැතිය නොමැති කටයුතු සඳහා යොමු වී තිබේ. | 2018 ඔක්තෝබර් පැවති දේශපාලන අස්ථාවරභාවය හේතුවෙන් කැබිනට් අනුමැතිය ලැබී නොතිබුණු අතර 2019 දී අදාළ අනුමැතිය ලබා ගැනීමට පියවර ගනු ලැබේ. | රෙගුලාසි සමඟ අනුගත වීමට සහ අදාළ අධිකාරීන්ගෙන් අනුමැතිය ලබාගැනීමට කඩිනම් පියවර ගැනීම අවශ්‍ය වේ. |
| (iii) | ව්‍යාපෘතියේ කටයුතුවල සුමට මෙහෙයුමට සෘජුව බලපාන ලෙස උප ව්‍යාපෘතිවල විවිධ කාණ්ඩ යටතේ වැඩ සහ භාණ්ඩ අයිතම් 120 ක් මිලදී ගැනීමේ ක්‍රියාවලිය මාස 10 ක ප්‍රමාදයක් සහිතව ක්‍රියාත්මක කර තිබුණි. | ව්‍යාපෘතියේ භෞතික කාර්යසාධනයට අවාසිසහගත ලෙස බලපානු ඇත. | සමහර කොන්ත්‍රාත්වල සංකීර්ණ බව හේතුවෙන් ඒ සම්බන්ධ ප්‍රසම්පාදන ක්‍රියාවලිය දීර්ඝ කාලයක් ගෙන තිබුණි. | ව්‍යාපෘතියේ අරමුණු ලගාකර ගැනීමට ප්‍රසම්පාදන කටයුතුවල ප්‍රගතිය අධීක්ෂණයට සහ ඇගයීමට විධිමත් පියවර ගැනීම අවශ්‍ය වේ. |
| (iv) | 2018 දෙසැම්බර් 31 දිනට වර්ෂ 01 සිට වර්ෂ 2 ½ දක්වා කාල පරාසයක ප්‍රමාදයන් සහිතව උප ව්‍යාපෘති යටතේ සම්පූර්ණ කරන ලද වැඩ භාරදී තිබුණි. | ඇල්ම ඇති පාර්ශවයන් වෙත අපේක්ෂිත ප්‍රතිලාභ කාලෝචිත ආකාරයට නොලැබේ. | කොන්ත්‍රාත්කරු විසින් කටයුතු භාරදීමේ ප්‍රමාදයන් මත ප්‍රමාද ගාස්තු අයකර ගැනීමට ව්‍යාපෘතිය පියවර ගනු ලැබේ. | කොන්ත්‍රාත්කරුවන්ගේ කටයුතුවල ප්‍රගතිය ඇගයීම කාලෝචිත ආකාරයට සිදුකිරීම අවශ්‍ය වේ. |

**3.4 මානව සම්පත් කළමනාකරණය පිළිබඳ ගැටළු**

**---------------------------------------------------**

නියෝජ්‍ය /ජ්‍යෙෂ්ඨ ව්‍යාපෘති අධ්‍යක්ෂ, විශේෂඥ, ජ්‍යෙෂ්ඨ ඉංජිනේරු සහ ගෘහ නිර්මාණ ශිල්පීයන් වැනි ව්‍යාපෘති - මෙහෙයුම් ඒකකයේ ප්‍රධාන කළමනාකරණ තනතුරු නිරන්තරයෙන් පුරප්පාඩුව පවතින අතර ව්‍යාපෘතියේ අනුමත කාර්යමණ්ඩලයේ තනතුරු ඉක්මවා පහළ ශ්‍රේණිවල නිලධාරීන් බඳවා ගෙන තිබුණු බව නිරීක්ෂණය විය. ව්‍යාපෘතියේ අරමුණු ලඟාකර ගැනීම් සඳහා පවරන ලද කටයුතු කාලෝචිතව නිම කිරීමට අවශ්‍යවන අතර එය ව්‍යාපෘතියේ සුමට ක්‍රියාකාරීත්වයට බලපානු ඇත.

### 3.5 පද්ධති හා පාලනයන්

----------------------------

| විස්තරය | බලපෑම | කළමනාකරණයේ ප්‍රතිචාර | විගණකගේ නිර්දේශය |
| --- | --- | --- | --- |
| තත්‍ය කාලීන ඒකාබද්ධ ගංවතුර කළමනාකරණ පද්ධතියේ රු.මිලියන 29.71 ක් වටිනා මුළු වත්කම්වලින් සමාලෝචිත වර්ෂය තුළදී රු.මිලියන 2.74 ක් වටිනා ස්ථාවර වත්කම් කොටසක් පමණක් ක්ෂය කර තිබුණු බව නිරීක්ෂණය විය. | ගිණුම්කරණ ප්‍රතිපත්ති අනුචිත යොදා ගැනීමකි. | මෙහෙයුම් වියදම්වල ප්‍රතිවිරුද්ධ අරමුදල් ගිණුමෙන් ප්‍රසම්පාදනය කළ වත්කම් ව්‍යාපෘතියේ ස්ථාවර වත්කම් ලෙස වාර්තා කර ක්ෂය කර තිබුණි. | ගිණුම්කරණ ප්‍රමිතයේ දක්වා ඇති ක්‍රමවේදය අනුගමනය කිරීම අවශ්‍ය වේ. |